## 01. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය

ජාතික ව්‍යාපාරයක් යනු මූලික වශයෙන් අදහස් කරනු ලබන්නේ විදේශීය දේශපාලන බලයවෙතින් ජාතික නායකත්වයකට බලතල ලබා ගැනීම සඳහා සැකසූ ව්‍යාපාරයක් ජාතික ව්‍යාපාරයක් යනුවෙන් හඳුන්වයි. මෙහිදී විදේශීය බලමුලයන් වෙතින් එම රටේ දේශීය නායකත්වයට එම බලය නැවතත් ලබා ගැනීම සඳහා ජාතික ව්‍යාපාර මඟින් කටයුතු කරනු ලැබිය. ශ්‍රී ලංකාවේ ද ජාතික ව්‍යාපාරය බ්‍රිතාන්‍යයට එරෙහිව පැනනැගුණු අතර, ක්‍රමයෙන් ලංකාවේ ජාතික ව්‍යාපාරය ආගමික බලපෑම මත ද වර්ධනය වීම දක්නට ලැබිණි. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයට පදනම වූ ආර්ථික , සමාජ හා දේශපාලන පසුබිම අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලංකාව පාලනයට නතු වී සිටි පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් ලංකාව පාලනය කිරීමේ දී අනුගමනය කළ සමාජ , ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය සම්බන්ධයෙන් සෘජුවම බලපානු ලැබීය. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ මුල් යුගය 1500 ගණනන්වල ආගමික පුනරුද ව්‍යාපාර ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ආරම්භක යුගය වශයෙන් හැඳින්විය හැකිය. මෙම පුනරුද ව්‍යාපාරය බිහිවීමට පෘතුගීසීන් විසින් ස්වදේශීය ආගම් යටපත් කිරීමට දැරූ උත්සාහය හේතු විය. ඉන් පසුව ලන්දේසීන්ගේ ආගමික හා සමාජ ප්‍රතිපත්ති ලංකාවේ ජාතික ව්‍යාපාරය මර්දනයට බලපෑ අතර, ඉංග්‍රීසීන්ගේ සමාජ , ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති ජාතික ව්‍යාපාරයේ වර්ධනයට බලපෑමක් කළේය.

ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ වර්ධනය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය.

1. 1900 ට පෙර යුගය
2. 1900 ට පසු යුගය

### ලංකාවේ ජාතික ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය

ලංකාවේ ජාතික ව්‍යාපාරයේ දක්නට ලැබුණු මූලික දුර්වලතාවය වූයේ සෑම යුගයකදීම සංවිධානාත්මක ශක්තිමත් ව්‍යුහයක් විද්‍යමාන නොවීමයි. මෙම හේතුව නිසා ජාතික ව්‍යාපාරයේ සෑම යුගයකදීම පැහැදිලි නායකත්වයක් දක්නට නොලැබිණි. නමුත් එක් එක් යුගවලදී ආගමික සමාජීය අර්ථයෙන් නායකත්වයන් බිහිවන ආකාරය දැකිය හැක. එහි ප්‍රධාන ප්‍රවාහයන් 03 ක් විය.

1. ආගමික පුනරුදවාදී කණ්ඩායම්
2. ග්‍රාමීය සම්භවයක් සහිත ගිහි නායකත්වය
3. ප්‍රතිසංස්කරණවාදී සුළු ධනේශ්වර පංතිය

මෙම කණ්ඩායම් තුන අතරින් පළමු හා දෙවන කණ්ඩායම් යටත්විජිත පාලකයින් විසින් ලංකාවේ ආගම, භාෂාව හා දේශීයත්වය යටපත් කිරීමට එරෙහිව නැගීසිටි අතර, තුන්වන කණ්ඩායම අධිරාජ්‍යවාදීන් හා සහයෝගයෙන් තම පංති ආශාවන් ඉටු කර ගැනීම සඳහා සහයෝගයෙන් කටයුතු කළ ආකාරය දැකිය හැක.

## <u>අරමුණු හා ක්‍රියාමාර්ග</u>

ලංකා ජාතික සංගමයට පැහැදිලි අරමුණක් හෝ ක්‍රියාමාර්ගයක් නොවීය. 1924 ඔක්තෝම්බර් 27, 28 දිනවල පැවැති ලංකා ජාතික සංගමයේ විශේෂ සම්මේලනයේදී එවකට ලංකා ජාතික සංගමයේ සභාපතිවරයා වූ එච්. ජේ. සී පෙරේරා ප්‍රකාශ කළේ ,

**" මෙම සංගමයේ ආරම්භක අරමුණ බ්‍රිතාන්‍ය ධජය යටතේ අභ්‍යන්තර පාලනයක් ලබා ගැනීමයි. එය මතක තබා ගන්න. අප එයට නිදහස කියන්නේ නැත. අප එය කවදාවත් නොඉල්ලුවෙමි එය ඉල්ලීමට තරම් අප මෝඩයින් නොවේ."**

ලංකා ජාතික සංගමය කිසිවිටෙකත් ස්වරාජ්‍යය ඉල්ලා සිටියේ නැත ස්වරාජ්‍යයක් දිනා ගැනීමට පැහැදිලි ආර්ථික හා දේශපාලන අරමුණු නොවීය. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලබා ගැනීම මඟින් තම පංතියට ඇතුලත් වීම සහ ආණ්ඩුක්‍රමයේත් පරිපාලනයේත් ප්‍රතිසංස්කරණ ලබා ගැනීම මූලික අරමුණ විය. එනම්, පරිපාලන ක්‍රමය තුළ 50% - 75% ප්‍රමාණයක් ලාංකිකයින් බඳවා ගැනීම , විශ්වවිද්‍යාලයක් පිහිටුවීම , අධ්‍යාපනය සඳහා රජයේ වියදම් වැඩි කිරීම සහ එම අරමුණු ධනපති පංතිය මත පදනම් වූ ඒවා විය. ජාතික සංගමයට ඒකාබද්ධ ජාතික වැඩපිළිවෙළක් නොවීය. ඔවුන් ඡන්දය දිමෙදී පවා සාමූහිකව ක්‍රියානොකළේය. ඔවුන් බොහෝවිට සිදු කළේ සාකච්ඡා පැවැත්වීම, පෙත්සම් යැවීම, ශාස්ත්‍රීය තර්ක ඉදිරිපත් කිරීම, නියෝජිතයන් යැවීම , ව්‍යවස්ථාදායකයේ නිලනොලත් මන්ත්‍රීන් වැඩි කිරීම වැනි ක්‍රියාමාර්ගයන්ය.

## 02. 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය

මෙම ප්‍රතිසංස්කරණය ලංකාවේ දේශපාලන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයක් වේ. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන් යටතට පත් වූ පසු හඳුන්වාදුන් ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මෙය වේ. මෙම ආණ්ඩුක්‍රමය විශ්ලේෂණයේ පහසුව සඳහා අනු මාතෘකා 03 ක් යටතේ විස්තර කරනු ලැබේ.

01. **1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය හඳුන්වාදීමේ පසුබිම**
02. **කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මඟින් හඳුන්වා දුන් ප්‍රධාන යෝජනා (දේශපාලන, සමාජ හා ආර්ථික)**
03. **එම ප්‍රතිසංස්කරණයේ වැදගත්කම**

කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට මූලික හේතුන් වූයේ ද්විත්ව පරිපාලන දුෂ්කරතාවන්, 1815 ලංකාව බ්‍රිතාන්‍යය පූර්ණ යටත් විජිතයක් බවට පත්වීම හා බ්‍රිතාන්‍යයන් ලංකාව යටත් විජිතයක් වශයෙන් අපේක්ෂා කළ ලාභදායකත්වය පැවැති පාලනය මඟින් ලබා ගත නොහැකි වීමයි.

කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වාදුන් ප්‍රධාන යෝජනා දේශපාලන සමාජීය හා ආර්ථික වශයෙන් විග්‍රහ කළ හැකිය.

- **දේශපාලන ප්‍රතිසංස්කරණ - මධ්‍යගත පාලනයක් ඇති කිරීම පිණිස පැවැති පාලන ක්‍රමය සංශෝධනය කිරීම, ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම, විධායක සභාවක් පිහිටුවීම , අධිකරණ ක්‍රමය සංශෝධනය, පැවැති ගම් සභා ක්‍රමය අහෝසි කිරීම, ආණ්ඩුකාරවරයාගේ බලතල සංශෝධනය කිරීම.**
- **ආර්ථික ප්‍රතිසංස්කරණ - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම , වෙළෙඳ හා වාණිජ කටයුතු සම්බන්ධයෙන් එතෙක් පැවැති රජයේ ඒකාධිකාරිය අහෝසි කිරීම , සිවිල් සේවාව ප්‍රතිසංස්කරණය කිරීම , ආනයන අපනයන ආර්ථිකයක් හඳුන්වාදීම , ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම.**
- **සමාජීය ප්‍රතිසංස්කරණය - ඉංග්‍රීසි භාෂාව රජයේ භාෂාවක් බවට පත් කිරීම , ඉංග්‍රීසි අධ්‍යාපන ක්‍රමය හඳුන්වාදීම.**

## 03. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

1931 ඩොනමෝර් කොමිසම මගින් ලංකාවට කැබිනට් ආණ්ඩුක්‍රමයක් ප්‍රධානය නොකළ අතර, ඒ වෙනුවට ඉදිරිපත් කරනු ලැබුවේ. විධායක කාරක සභා ක්‍රමයකි. ඩොනමෝර් කොමිසම විසින් පූර්ණ වගකීම් සහිත පාලනයක් ලාංකීකයින්ට ලබාදීමට අකමැති වූ අතර, අර්ධ පාලන බලයක් ලබාදීමට එකඟ විය. මේ අනුව වැදගත් විධායක අංශ බ්‍රිතාන්‍යයින් වෙත තබා ගැනීම ඩොනමොර් ප්‍රතිසංස්කරණ වෙතින් තීරණය විය. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වාදුන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභිකයින් 61 වන අතර එය පහත පරිදි වේ.

- ❖ ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාශ මට්ටමින් සභිකයින් 50
- ❖ ආණ්ඩුකාරවරයා විසින් පත් කළ සභිකයින් 08
- ❖ රාජ්‍ය නිළධාරින් 03

මෙම ඩොනමෝර් ප්‍රතිසංස්කරණයන්හි ප්‍රධාන යෝජනා වශයෙන්

- වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
- සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම
- රාජ්‍ය මන්ත්‍රණ සභාව ස්ථාපිත කිරීම
- විධායකකාරක සභා ක්‍රමය හඳුන්වාදීම

මෙම ඩොනමෝර යෝජනා මගින් සිදු වූ සාධනීය ප්‍රතිඵල වශයෙන්

- නව දේශපාලන සංස්කෘතියකට ශ්‍රී ලාංකීක ජනතාව හැඩ ගැසීම
- සර්වජන ඡන්ද බලය ලැබීම හේතුවෙන් මහජනයා තුළ දේශපාලන අවබෝධයක් ඇති වීම
- දේශපාලන පක්ෂ ක්‍රමයක් ලංකාවේ බිහිවීමට පදනම දැමීම
- සුභ සාධන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- දේශපාලන නියෝජිතයන් හා ඡන්ද දායකයින් අතර, සෘජු සබඳතාවන් ඇති වීම
- සර්වජන ඡන්ද බලය හේතුවෙන් දේශපාලන සමානාත්මතාවයක් ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය තුළ ඇති වීම

## 04.1948 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

සොල්බරි ආණ්ඩුක්‍රමයේ මූලික ලේඛන 03 කි.

- 1946 ලංකා ආණ්ඩුක්‍රම රාජාඥාව
- 1947 ලංකා නිදහස් රාජාඥාව
- 1947 ලංකා ස්වාධිනතා පනත

මෙයින් වඩාත් වැදගත් ලේඛනය වන්නේ 1946 ලංකා ආණ්ඩුක්‍රම රාජාඥාවයි. සොල්බරි ව්‍යවස්ථාව මූලික ආකෘතිය අතින් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ආකෘතියට සමාන විය. එය වෙනස් වූයේ අතුරු අංශවලින් පමණි. උදාහරණ වශයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික වශයෙන් නිර්ලිඛිත එකක් විය. නමුත් සොල්බරි ව්‍යවස්ථාව ලිඛිත ව්‍යවස්ථාවක් විය. මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වාදුන් මූලිකාංග පහත සඳහන් වේ

- අග්‍රාණ්ඩුකාරවරයා
- ද්විත්ව මන්ත්‍රී මණ්ඩලය
- අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය
- අධිකරණ ක්‍රමය
- සරල බහුතර නියෝජන ක්‍රමය
- පරිපාලන ක්‍රමය
- සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොදා තිබූ විධිවිධාන

සොල්බරි ආණ්ඩුක්‍රමය 1948 සිට ක්‍රියාත්මක වූ අතර, එය ක්‍රියාත්මක වී වර්ෂ කිහිපයක් ගතවන විට මෙම ආණ්ඩුක්‍රමයේ අසාර්ථකභාවය විවිධ අංශවලින් විවේචනය විය. එම විවේචන මඟින් ඉදිරිපත් කරන තර්ක නම්,

- සොල්බරි ආණ්ඩුක්‍රමය නිදහස් රටකට නොගැලපෙනවා යන තර්කය.
- 1948 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය තිබීනොවීම
- දේශීය ජනතාවගේ සහභාගිත්වයෙන් තොරව නිර්මාණය කළ ආණ්ඩුක්‍රමයක් වීම
- සොල්බරි ව්‍යවස්ථාවේ ආයතනික රටාවේ දුර්වලතා
- යම් රටක ආණ්ඩුක්‍රමය හා පරිසරය අතර පැවැතිය යුතු සම්බන්ධය නොසළකා හැරීම
- ජාතික සංකේත අඩංගු නොවීම

ඉහත සඳහාත් දුර්වලතාවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සොල්බරි ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූයේ අවුරුදු 20 ක පමණ කාලයක් වන අතර, එම ව්‍යවස්ථාව වෙනස් කොට නව ව්‍යවස්ථාවක් නිර්මාණය කළ යුතු යැයි යන කතිකාව ශ්‍රී ලංකාවේ දේශපාලන සංන්දර්භය තුළ ප්‍රධාන මාතෘකාවක් වේ. 1970 බලයට පත් වූ සමගි පෙරමුණ ආණ්ඩුව සොල්බරි ව්‍යවස්ථාව ප්‍රතික්ෂේප කොට 1972 නව ජනරජ ව්‍යවස්ථාවක් සම්පාදනය කරනු ලැබේ.

## 05 . ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති

- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ආරම්භ වන්නේ 1948 සොල්බරි ආණ්ඩුක්‍රමයත් සමඟිනි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයින් ලංකාවට නිදහස ප්‍රදානය කිරීම සමඟිනි.

- ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ පරිනාමය
  - 1948 – 1956 කාලය
  - 1956 – 1962 කාලය
  - 1962 – 1970 කාලය
  - 1970 – 1977 කාලය
  - 1977 - 1994 කාලය
  - 1994 – 2005 කාලය
  - 2005 සිට වර්තමානය දක්වා කාලය